චක්‍රලේඛ අංක :- PRE/2024/39

TR - 04

ඉතා වැදගත්

මගේ අංකය:-TR/PRE/CIR/2024
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2024.08.18

**සියළුම දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් සහ**
**නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,**

**ජනාධිපතිවරණය -2024.09.21**
**තැපැල් දෙපාර්තමේන්තුව හා පොලිස් දෙපාර්තමේන්තුව සඳහා වාහන ලබාදීම.**

ඉහත ඡන්ද විමසීමට අදාළ නිල ඡන්ද දැන්වීම්පත් බෙදාහැරීම පිණිස තැපැල් දෙපාර්තමේන්තුව සතු වාහන ප්‍රමාණවත් නොවිය හැකි හෙයින් එම කාර්යය ඉටු කර ගැනීම සඳහා රජයේ වාහන කිහිපයක් ලබාදෙන ලෙසට ඔවුන් ඔබෙන් ඉල්ලා සිටියහොත් ඒ සඳහා ඔබගේ දිස්ත්‍රික්කයෙන් රජයේ වාහන කිහිපයක් ලබාදීමට කරුණාකර කටයුතු කරන්න. එසේ ලබා දෙන **වාහන වලට සපයනු ලබන ඉන්ධන සඳහා වන වියදම් තැපැල් දෙපාර්තමේන්තුව විසින් දැරිය යුතුය. එකී රථවල රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ආදී ගෙවීම් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විසින් කළ යුතුය.** ඉහත ඡන්ද විමසීමට අදාළව තැපැල් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන රාජකාරී සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ඉදිරියේදී ඔවුනට වෙන්කර දෙනු ඇත.

02. ජනාධිපතිවරයා තෝරාපත්කර ගැනීමේ ඡන්ද විමසීමේදී ආරක්ෂක රාජකාරී ඉටුකිරීම සඳහා පොලිස් දෙපාර්තමේන්තුවට ද වාහන විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වන හෙයින් ඔවුන් විසින් ද රජයේ වාහන ලබා ගැනීම පිණිස තේරීම්භාර නිලධාරීන් වෙත ඉල්ලීම් ඉදිරිපත් කරනු ඇත. එවැනි අවස්ථාවන්හිදී ඔබගේ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් තිබේ නම් පමණක් රජයේ වාහන කිහිපයක් පොලිස් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය සඳහා ලබාදීමට කටයුතු කළ හැකිය. එසේ වාහන ලබාදුනහොත් ඡන්ද විමසීම නිමාවී දින 03 ක් ගතවීමට මත්තෙන් අදාළ වාහන ආපසු එම ආයතන වෙත භාරදීමට ද ක්‍රියා කළයුතු බවට ඔවුන්ව දැනුම්වත් කරන්න. මෙසේ ලබාදෙන **වාහන වලට අවශ්‍ය ඉන්ධන වියදම් පොලිස් දෙපාර්තමේන්තුව විසින් දැරිය යුතු අතර, රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ආදී ගෙවීම් අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය මගින් සිදු කළ යුතුය.**

03. තවද පොලීසියට අවශ්‍ය වාහන පොලිස්පතිවරයාගේ අනුමැතියට යටත්ව කුලී පදනම මත ද ලබාගත හැකි අතර කුලී පදනම මත වාහන ලබාගැනීමේ චක්‍රලේඛයේ (චක්‍රලේඛ අංක PRE/2024/40 බලන්න) සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ඔවුනට පෞද්ගලික වාහන ද ලබාගත හැකිය.

04. <u>ඡන්ද විමසීමේදී පොලිස් දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සඳහා ලබාගන්නා පෞද්ගලික වාහන ධාවනයට එක්කිරීමට ප්‍රථම ඒ ඒ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කළයුතු අතර අවශ්‍යතා අනුව හා සුදුසු වාහන තෝරා ගැනීම පොලිස් දෙපාර්තමේන්තුවට කළ හැකි වේ.</u>

ඡන්ද විමසීම අවසන්වීමෙන් පසු පොලිස් දෙපාර්තමේන්තුව මගින් ලියාපදිංචි කර එසේ යොදා ගන්නා ලද වාහන වල තොරතුරු අඩංගු වාර්තාවක් අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය හරහා මැතිවරණ මහලේකම් කාර්යාලයේ අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත එවිය යුතු වේ. පොලිස් දෙපාර්තමේන්තුව වෙත මීට අදාළ ප්‍රතිපාදන වෙන් කරන විට මෙම වාර්තාවට අනුව කටයුතු කරන බවද දන්වා සිටිනු කැමැත්තෙමි.

05. ශ්‍රී ලංකා යුධ හමුදාව කිසියම් කාර්යයකට කැඳවන්නේ නම් එසේ කරනු ලබන්නේ පොලිස් දෙපාර්තමේන්තුවේ සහාය සඳහාම වන බැවින් හමුදා අවශ්‍යතා සඳහා සපයනු ලබන වාහන සඳහා වන සියළුම ගෙවීම් පොලිස් දෙපාර්තමේන්තුව විසින් කළයුතු වේ.

සමන් ශ්‍රී රත්නායක,
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

පිටපත්: 01. විගණකාධිපති - කාරුණික දැන ගැනීම පිණිස.

02. තැපැල්පති, - තැපැල් මූලස්ථානය. } සියළුම ප්‍රාදේශීය තැපැල් අධිකාරීවරුන් සහ අදාළ නිලධාරීන් දැනුම්වත් කිරීමට කාරුණිකව

03. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, පරිපාලන සහ මධ්‍යම පළාත පොලිස් මූලස්ථානය. } දැනගැනීම සඳහා හා අදාළ නිලධාරීන් දැනුම්වත් කිරීම සඳහා කාරුණිකව.

04. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (ප්‍රජා පොලිස්, සංචාරක, ආයෝජන හා මැතිවරණ)

05. යුද හමුදාපති, යුද හමුදා මූලස්ථානය } කාරුණික දැන ගැනීම පිණිස.

06. ලේකම්, මැතිවරණ කොමිෂන් සභාව - කාරුණික දැන ගැනීම පිණිස.

07. අතිරේක මැතිවරණ කොමසාරිස් ( ජාතික මැතිවරණ/ පාලන) - කාරුණික දැන ගැනීම පිණිස.

08. ප්‍රධාන මූල්‍ය නිලධාරී
09. ප්‍රධාන අභ්‍යන්තර විගණක } කාරුණික දැන ගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා